




සම්මානිත මහාචාර්ය
කුසුමා කරුණාරත්න

# එදා අප උගත් යහගුණ අද බාල පරපුරට අකැපද ?

***"උතුම් වූ මිනිසත් බව ලැබ සිටින අපි එහි අගය හා ගෞරවය රැකෙන සේ ජිවත් විය යුතු වෙමු. සාරවත් දිවි පෙවෙතකට අවශ්‍ය වන යහපත් ගුණධර්ම බොහෝ දුරට ආගම දහම මගින් ඉගැන්වෙයි. බෞද්ධ සංස්කෘතික පසුබිමක උරුමකම් කී ජනතාව තුළ මෙම යහපැවැත්ම වර්ධනය කරනු වස් එකී ඉගැන්වීම් මහෝපකාරී වූ බව ප්‍රකට කරුණකි. එසේ වුවද, කාලාන්තරයක් තිස්සේ බුදුදහම මගින් මිනිස් සමාජය වෙත පතුරුවා ලූ යහපත් අදහස් අද ජන සමාජය වෙතින් වියැකී යමින් පවතින බවට නැගෙන චෝදනා අනල්පය."***

යහමග කරා - සුධර්මා පණ්ඩිත, 2007

මීට වසර හයකට පෙර, සුධර්මා පණ්ඩිත මහත්මිය, (මාගේ සුහද මිතුරිය) ඉටු කළ යහපත් කාර්යයකට සුළු වශයෙන් දායක වන්නට මට අවස්ථාව ලැබිණ. බුදු දහමේ අන්තර්ගත, විශේෂයෙන්ම සූත්‍ර පිටකයේ සඳහන් වන තොරතුරු ඇසුරින්, වර්තමාන සමාජයට වැඩදායක වන කරුණු රැසක් අළලා ඇය රචනා කොට ප්‍රකාශයට පත් කළ 'යහමග කරා' නම් කෘතියට මා සපයා දුන් පෙරවදනෙහි ආරම්භක ඡේදයයි, ඉහතින් සඳහන් කළේ. එදා සමාජය තුළ වූ යහපත් සාරධර්ම, අදහස් උදහස් අද සමාජයෙන් තුරන් වී යාමේ තර්ජනයක් ඇති බවට බොහෝ කරුණු මෙන්ම සාධක ද අද අපට අසන්නට, දකින්නට ලැබේ.

මානව සමාජය කලින් කලට, යුගයෙන් යුගයට විවිධ වෙනස්කම් හා නානාප්‍රකාර විපර්යාසවලට ලක් වෙමින් පැවත අවුත් තිබෙන බව අමුතුවෙන් කිව යුතු නොවේ. "අපේ කාලේ නම් මෙහෙම දේවල් සිද්ධ වෙලා නැතැ"යි අපගේ වැඩිහිටියෝ නොයෙක් අවස්ථාවලදී පැවසූ අයුරු අපට මතකය. අද අපි ද, එලෙසින්ම, අපේ බාල පරපුර විවේචනය කරන්නට යොමු වී සිටිමු. එමතු විවේචනයට ලක් කරන අවස්ථා ද අපට අසන්නට ලැබී ඇත. එසේ නම්, මෙයින් හෙළි වන ධර්මතාව කුමක් ද ? මානව වර්ගයා වූ කලී, නිරන්තරයෙන්ම තම හැසිරීම් රටාව, ක්‍රියා කලාපය වෙනසට භාජන කරමින් ඉදිරියට යන පිරිසක් බවයි.

එක තැන පල් වෙමින් තිබෙන මඩ වගුරක් නොවේ. කලින් කලට වසින වැසි, පායන අව්ව, හමන සුළඟ හෝ කුණාටු මේ ආදිය සමඟ නිරන්තරයෙන් වෙනස් වෙමින් ඉදිරියට ගලා යන ගංගාවක් වැන්නකි. එම ගංගාවට දෙපස ඉවුරු කඩා හැළෙන මඩ එක් විය හැකිය. සුළගෙන් ගෙන එන රොඩු බොඩු එක් විය හැකිය. ඒවා හැකි තරමින් උතුරුවා දමමින් හෝ ඇතැම් විට ගං පත්ලෙහි තැන්පත් කරවමින් ගඟ නිරන්තරයෙන් ගලා බසී.

මිනිස් සමාජය ද එවැන්නකි. අපි කලින් කලට, එහෙන් මෙහෙන් එන දේ උකහා ගන්නෙමු. කලක් ඒවායේ රස විඳගනිමින් සිට එපා වූ විට ඒවා ඉවතත ලන්නෙමු. වඩා යහපත් සේ පෙනෙන අලුත් දේ යළිත් උකහා ගන්නෙමු. කරුණු එසේ වුවද, විශ්ව සමාජය පොදුවේ ගත් විට හා අප ජිවත් වන පරිසරය විශේෂ කොට ගත් විට එක් අතකින් සංවර්ධනයක් ද අනිත් අතින් පරිහානියක් ද දකිමු. භෞතික වශයෙන් ශීඝ්‍රයෙන් සංවර්ධනය වන අපගේ ආධ්‍යාත්මික දියුණුවක් ඒ හා සමාන්තරව සිදු වේද යන්න ප්‍රශ්නයකි.

අප බාල වියේ හැදුණ වැඩුණ පරිසරය 'පවුල' නමැති සමාජ ඒකකය ශක්තිමත් කරන්නට මෙන්ම, ඒ සමගම සුහද සමාජ සම්බන්ධතා තර කරගන්නට ද බෙහෙවින් උපකාරී විය. එදා ගැමි පරිසරයේ හැදුණ වැඩුණ දරුවන්ට, පවුල තුළින්ම ලද සමාජානුයෝජනය හේතු කොටගෙන සංස්කෘතික අගයන් හා සාරධර්ම සිය හැසිරීම් රටාවෙහි අන්තර්ගත අංග බවට පත් කරගත හැකි විය. පවුල තුළ පියා ගෞරවනීය ස්ථානයක ලා සැලකුණ අතර මවගේ ඇල්ම බැල්ම, ආදරය හා සෙනෙහස සමග දරුවන්ගේ ස්වභාවික, භෞතික මෙන්ම ආධ්‍යාත්මකික වර්ධනය ද සිදු විය. දෙමාපියන්ට ගරු කිරීමට පවුල තුළින්ම ලද ශික්ෂණය වඩාත් තර කර ලන්නට ඔවුන්ට ගුරු ගෙදරකදී කියා දුන් පොත පත උපකාරී විය.

"මවුපියො උතුම් මය
අපගෙ තපර දෙවිවරු මය
අප රකිනුවෝ මය
වඳිමු මවුපිය දෙදෙන මහිමය"

සිරිත් මල්දම, 14 පද්‍ය

බුදුදහම මගින් දෙන ශික්ෂණය හේතු කොටගෙන මෙවන් හැඟීම් දරුවන් තුළ නිතැනින්ම පහළ වනු ඇත. කුඩා වියේදී දෙමාපිය සෙනෙහස නොමඳව ලබමින් හැදෙන වැඩෙන දරුවන් තරුණ වියට පත් වන විට අන් දෙසකට වැඩි අවධානය යොමු කරමින් දෙමාපියන් නොසලකා හරින්නට පෙලඹෙන අවස්ථා අද කොතෙකුත් දක්නට ඇත.

දරුවන්ගේ කාර්යබහුල ජීවන රටාව තුළ වැඩිහිටි දෙමාව්පියන්ට තැනක් නොලැබෙන අවස්ථා විරල නොවේ. වයසින් වැඩී, මහලු වී, ගත වැහැරී ගිය දෙමාපියන්ගේ දර්ශනය වුව සිතට ප්‍රිය නුපදවන බවක් සිතන දරුවන් අද සිටිය හැකිය. එහෙත් එදා බාල දරුවන්ට කියා දුන් ගුණ දහම් අනුව එවැනි දේට පෙළඹීමේ අවස්ථා විරල වුවාට සැක නැත.

"මහලු වී සිටියත්
රුවින් අඩු වී සිටියත්
දුප්පතිව සිටියත්
දෙමව්පිය වැඳ පුදනු යහපත්"

සිරිත් මල්දම, 23 පද්‍ය%

ශ්‍රී ලාංකික ටෙලිවිෂන් සංස්කෘතිය තුළ අද අප දකින, අපට බලෙන් පෙන්වන්නට යොමු වන, දර්ශන, ටෙලිනාට්‍ය ආදියෙහි ඇතැම් සිදුවීම් කල්පිත ලෙස ඉදිරිපත් වන ඒවා වුවත් විටෙක හද සසල කරවන දර්ශන ඒ අතර දක්නට ඇත. දාඩිය මහන්සියෙන් යමක් උපයා දරුවන්ට අධ්‍යාපනය දෙන දෙමාපියන් වයස්ගත වූ පසු ගමෙහි තනි වනු පමණක් නොව ඔවුන දැක බලාගෙන එන්නට දරුවන්ට විවේකයක් ද නැත. සිය වැඩිහිටි පියා පුතු සොයගෙන කාර්යාලයට ගියද, ඒ තම පියා බව ඇඟවීමට මැලි වන දු පුත්තු අද කොතෙක් නම් ඇද්ද ? සිරිත් මල්දම කතුවරයා එකල දරු පරපුරට සිහිපත් කර දුන් දේ අද තරුණ දු පුතුන්ට සිහිපත් කර දීමට ඇත්තේ මෙවන් ටෙලිනාට්‍ය පමණක්ද? ඒවායේ යම් තරමකට හෝ අන්තර්ගත උක්ත සංවේදී පුවත් අද දූ දරුවන් කොතරම් දුරට



ගණනකට වත් ගන්නවාද යන්න ද ප්‍රශ්නයකි.

එදා ගැමි සංස්කෘතිය තුළ ජිවත් වූ ජනතාව වැඩිහිටි බවට ගරු කරන්නට නැඹුරු වූ පිරිසකි. වැඩිහිටි බවට ගෞරව ලැබීම ඇතැම් විදේශීය රටවල ගැමි සමාජ වෙතින් ද අපට දකින්නට ලැබේ. නයිජිරියානු ජාතික චිනුවා අචෙබෙ නම් විශිෂ්ට නවකතා කරුවාගේ බොහෝ නවකතාවල එරට, ඉබෝ ගෝත්‍රිකයන් අතර වැඩිහිටි ගෞරවය ඉහළින්ම සැලකූ අයුරු දැක්වෙන යෙදුම් බහුලය. ශ්‍රී ලාංකික අප ළමා වියේදී දුටු විවිධ අවස්ථා සිහිපත් කරන විට ද වැඩිහිටි ගෞරවයට අපේ සංස්කෘතිය තුළ හිමි වූ තැන ගැන සිතාගත හැකිය. නිවසක හෝ වෙනත් ස්ථානයක අසුන් ගෙන සිටින වයසින් බාල වුවකු, වැඩිහිටියකු දුටු ගමන් අසුනින් නැගී සිටීමෙන් ගෞරව දැක්වීම විශේෂයෙන්ම සිදු වුවකි.

නූතන බාල පරපුර අතර ද මෙබඳු ගුණ ධර්ම හුරු පුරුදු දරු දැරියන් සොයාගත හැකිය. එසේ වුවද වැඩි වශයෙන් එලෙස සිදු නොවන අවස්ථා ඇතැයි කීම සාවද්‍ය නොවේ. විශේෂයෙන්ම ප්‍රවාහන පහසුකම් පිළිබඳ ගැටලු පවත්නා අවස්ථාවලදී සියලු දෙනාගේ අවධානය යොමු වන්නේ තමන්ගේ ගමන ඉක්මනින් යෑම ගැනමය. බස් රථයකට ගොඩ වෙද්දී සෙස්සන් පෙරළාගෙන හෝ ඊට ඇතුල් වී අසුනක් සොයාගැනීම කාගේත් අවශ්‍යතාව වනු ඇත. එවන් විටකදී වැඩිහිටියකු, විශේෂයෙන්ම වයස්ගත දුබල පුද්ගලයකු වෙනුවෙන් එම ඉඩ පරිත්‍යාග කිරීමට කී දෙනෙක් නම් යොමු වනු ඇද්ද ?

සිරිත් මල්දම කතුවරයා බාල පරපුරට හොඳ සිරිත්, මල්දමක් මෙන් පලඳවන්නට යන්නේ මෙවැනි උපදෙස් ද දෙමිනි.

"ගුරුන් දෙගුරුන් වත්
වැඩිහිටි අන් කෙනෙකු වත්
කතාවක් කළ හොත්
නැගිට උත්තරදීම යහපත්"

සිරිත් මල්දම, 12 පද්‍ය

වාසනාවකට මෙන් අදත් අප රටේ පාසල්වල පන්ති කාමරයකදී ගුරුවරයකු අසන ප්‍රශ්නයකට, අසුනෙන් නැගී සිට උත්තර දීමට තරම් ශික්ෂණයක් අපේ දරුවන් තුළ ඇත. හුනස්නෙන් නැගිටීම යනු ගරු කළ යුත්තකුට ගරු කිරීමකි. බස් රථයක යද්දී වැඩිහිටියකු දැක අසුනින් නැගිට වාඩි වෙන්නට ආරාධනා කරන්නට යන කෙනකු දෙස උපහාසයෙන් බලන පිරිසක් ද සිටින්නට පුළුවන. එසේ වුවද දරුවන් බාල වියේ සිට මනා ශික්ෂණයකින් හදා වඩාගත හැකි නම් එවැනි මොහොතකදී සිය ආත්ම විශ්වාසය හා චිත්ත ශක්තිය නිසා සෙස්සන්ගේ සෝපහාස බැල්ම ගණන් නොගෙන අවංකව තම යුතුකම ඉටු කරන්නට කෙනකුට හැකි වනු ඇත.

වත්මන් සමාජය තුළ අධ්‍යාපන ක්ෂෙත්‍රයෙහි, පාසල් පද්ධතියෙහි සිදු වන විවිධ, විෂම සිදුවීම් ගැන බලන විට ගුරු - ශිෂ්‍ය සම්බන්ධතා හා ගුරු ගෞරවය පිරිහී තිබීම පිළිබඳව අපට සිතන්නට ඉඩ තබා ඇති අයුරු පෙනේ. "වේවැල් කෝටු නාරං සියඹලා අතු - කිතුල් පොල් ඉරටු වැල් කසඹිලිය අතු - මෙහැම ඉපල් මගෙ දෑසට නොපෑ යුතු - පමා නොවී එම් අකුරට මෙයින් මතු" යනුවෙන් අපි එදා පන්ති කාමරයේදී ශබ්ද නගා ගායනා කළේත්, එම උපදෙස් සිහියේ තබාගත්තේ ඉගෙනීමේ අගය, ගුරු ගෞරවය, කලට වෙලාවට වැඩ කිරීමේ වැදගත්කම යන මේ සියලු දේ ද සමගය.

නූතන අධ්‍යාපන රටාව තුළ පොතපතේ දැනීමත් පරිගණක ඥානයත් සමග බාල පරපුර සාරධර්ම වලින් ඈත් වී යාමට පටන්ගෙන ඇද්ද යන ප්‍රශ්නය දෙමාපිය වැඩිහිටි කාගේත් සිත් තුළ කැකෑරෙමින් පවතින ප්‍රශ්නයකි. ඉහතින් දැක්වූ අයුරින්, සමාජය කලින් කලට වෙනස්ව යද්දී එදා සිදු වූ දේ ඒ අයුරින්ම අද සිදුවිය යුතු යයි කීම හෝ ඒ සියලු දේ ඒ ආකාරයෙන් සිදු නොවන නිසා අද සමාජය අන්ත පරිහානි තත්වයකට ඇද වැටෙමින් පවතින බවත් හෝ අපට කිව නොහැකිය. කෙසේ වෙතත් බාල වියේ පසු වන දරුවන්ට මුල සිටම ලැබෙන අධ්‍යාපනය තුළ සාරධර්ම කෙරෙහි අඩු අවධානයක් තිබීම ප්‍රබල අහිතකර තත්වයකි.

'සුභාෂිතය'නම් පද්‍ය ග්‍රන්ථය වූ කලී ක්‍රි.ව. 1611 දී පමණ අලගියවන්න මුකවෙටි නම් පඬිවරයා විසින් ලියන ලද අගනා උපදේශ කාව්‍යයකි. එම කෘතිය සංස්කරණය කරමින්, ආචාර්ය හොරණ වජිරඥාන හිමිපාණන් පවසා ඇත්තේ, "සංස්කෘත උපදේශ කාව්‍යයන්ගේ ආභාසය ලබා ලියන ලද සුභාෂිතය, සාමාන්‍ය ජනතාවට පවා කියවා අවබෝධ කරගත හැකි, සරල බසින් හා සරල කාව්‍යෝක්තීන්ගෙන් ද යුක්ත" බවය. "සමාජ ජිවිතයේදී මුහුණ පෑමට සිදුවන විවිධ ප්‍රශ්නයන්ට අගනා විසඳුම් මෙම පද්‍යයන්හි ඇතුළත් වී" තිබෙන බව ද වජිරඥාන හිමියෝ එම සංස්කරණයෙහිදී පවසති. මෙවන් අගනා උපදේශ වැඩිහිටියන්ට පමණක් නොව බාල, තරුණ කාහට වුවද ශක්ති පමණින් අවබෝධ කරගැනීමට හැකි ඒවාය. වත්මන් පාසල් අධ්‍යාපනය තුළ මෙවන් අගනා සාරධර්ම දරුවන්ට කියා දීමේ අවකාශ මඳ වීම කනගාටුවට කරුණකි.

අද සමාජය තුළ වැඩිහිටියන් පමණක් නොව බාලයන් දරු දැරියෝද විවිධාකාර සමාජ ප්‍රශ්නවලට මුහුණ පාති. එයින් මන්දෝත්සාහී වීමත් ඇතැම් විට ජිවිතය කලකිරී අවාසනාවන්ත ඉරණමකට ගොදුරු වීමත් විටින් විට අසන්නට ලැබෙන සෝබර සිදුවීම්ය. එවන් අවස්ථාවලට විසඳුම් ලෙස මෙබඳු සාහිත්‍ය කෘතීන්හි අන්තර්ගත අගනා උපදෙස් දරුවන් වෙතට නොයාම ඛේදජනක තත්වයකි.

අධ්‍යාපන ක්ෂෙත්‍රය තුළ මතු වී ඇති තරඟකාරිත්වය අපේ බාල පරපුර ඉදිරියට ගෙන යාමට වඩා පසු පසට ඇද දමනු ලබන බලවේගයක් වැන්න. තම ශක්තියෙන් තමන් ඉදිරියට යාම යහගුණයක් වන අතර අනිකා පරදවා, තමන් ඉදිරියට යාම අයහපත් ලක්ෂණයක් බව දරුවනට කියා දෙන්නට මගක් නැති තරම්ය. බාල වියේ මෙන්ම තරුණ වියේදී ද ඇතැම් අයට සමාජයේ කවර හෝ දෙසකින් එල්ල වන බලපෑම්, පස්සට තල්ලු කිරීම් වැනි අයහපත් දේට මුහුණ දීමට සිදුවන අවස්ථා විරල නොවේ. එබඳු අත්දැකීමක් ලබන්නකුට පහත දැක්වෙන කවිය කොතරම් ශක්තියක් ලබා දෙනු ඇද්ද ?

"අමිත ගුණ නුවණ යුතු උතුමෝ පබඳ
අනත වෙහෙස ලදුවත් නොම වෙති දුහද
දිගත පතළ සුවඳැති සොඳ සඳුන් කඳ
සිඳිත මඬිත එක ලෙස පැතිරෙයි සුවඳ"

සුභාෂිතය, 46 පද්‍ය

තමන් මුහුණ දෙන කවර අභියෝගයකදී වුවත් මනසින් පරාජය නොවී ඉදිරියට යන්නට වෙර දරන කා හට වුවද සඳුන් ගස තැළීමෙන් වඩ වඩාත් විහිදෙමින් යන සුවඳ මෙන් සාර්ථකත්වය ලබාගන්නට හැකි වනු ඇත යන මෙම සිතුවිල්ල ඉතා අගනේය.

**අගෝස්තු සන්නස හා බැඳෙයි**